NATIONAL LIBRARY
N L S L OF SRI LANKA

# දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය 2021




ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය - 2021

# දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය - 2021

පර්යේෂණ අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2024**

**ISBN 978-624-5747-10-8**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද ප්‍රකාශනගත සූචිකරණ දත්ත

දෘශ්‍යාබාධිත පාසල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය - 2021. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2024.
පි. 26 සෙමී. 28

ISBN 978-624-5747-10-8

i.027.663072 ඩිවි 23

1. දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා පුස්තකාල-පාඨක අධ්‍යයනය
2. පුස්තකාල හා දෘශ්‍යාබාධිත පුද්ගලයින්-පාඨක අධ්‍යයනය

**සම්පාදන උපදේශකත්වය**

මහාචාර්ය නන්ද ධර්මරත්න - සභාපති

ඩබ්ලිව්. සුනිල් - අධ්‍යක්ෂ ජනරාල්

**සම්පාදක අධීක්ෂණය හා සංස්කරණය**

පද්මා බණ්ඩාරනායක - අධ්‍යක්ෂ
මෛත්‍රී ජයසුන්දර - නියෝජ්‍ය අධ්‍යක්ෂ
නිම්මි දේශප්‍රිය - සහකාර අධ්‍යක්ෂ

**පර්යේෂණය සැලසුම් කිරීම, ප්‍රශ්නාවලි සකස් කිරීම, දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා වාර්තාව ලිවීම**

උදිත ගුණසේකර - පර්යේෂණ නිලධාරි

**පර්යේෂණය සැලසුම් කිරීම සඳහා සහාය**

ජානකී ප්‍රනාන්දු - හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**පිටකවර නිර්මාණය**

තනුජා රංගිකා - කළමනාකරණ සහකාර

**ප්‍රකාශනය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක. 14, නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථන : 011 2968847
ෆැක්ස් : 011 2685201
විද්‍යුත් තැපැල් ලිපිනය : research@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk

## පෙරවදන

දෘශ්‍යාබාධිත හෝ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල සේවා සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයක් විසින් ඉටු කළ යුතු මූලික කාර්යයකි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආරම්භයේ සිටම දෘශ්‍යාබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත ජනතාව වෙත පුස්තකාල සේවා සැපයීම සම්බන්ධව අවධානය යොමු කොට ඇත. මේ සඳහා ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය තුළ වෙනම දෘශ්‍යාබාධිත අංශයක් පවත්වාගෙන යාම, විශේෂ ස්වරූපයේ ද්‍රව්‍යවල ජාතික එකතුවක් ගොඩ නැගීම, දෘශ්‍යාබාධිත සේවා සපයන බාහිර ආයතන සමඟ සහයෝගීව කටයුතු කිරීම, මහජන පුස්තකාල මගින් දීප ව්‍යාප්තව එම තොරතුරු සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම සහ සම්පත් බෙදාදීම සහ පුහුණු වැඩමුළු සංවිධානය වැනි කාර්යයන් රැසක් ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත ජනතාව නියෝජනය කරන විවිධ ප්‍රජාවන්ගේ තොරතුරු අවශ්‍යතාවල ස්වභාවය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයන් වල නිරත වීම එම ප්‍රජාවට අවශ්‍ය තොරතුරු සේවා සම්පාදනය සඳහා සැලසුම් කිරීමේ දී ඉතා වැදගත් වේ. ජාතික පුස්තකාලයේ පර්යේෂණ අංශය මගින් දෘශ්‍යාබාධිත පාසැල් ශිෂ්‍ය ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම සහ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටළු හඳුනාගැනීම සඳහා සිදු කරනු ලබන මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය එම දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ප්‍රජාව වෙත ප්‍රශස්ථ තොරතුරු සේවාවක් සැපයීම සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇත. මෙම අධ්‍යයනය තුළින් දෘශ්‍යාබාධිත සහ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය ප්‍රජාවෙහි කියවීමේ රුචිකත්වය වැඩි දියුණු කිරීම සහ ඒ පිළිබඳව ආකල්ප ප්‍රවර්ධනයට ද මඟපාදනු ලබයි. තොරතුරු අවශ්‍යතා සපුරා ගැනිමේ දී මුහුණපාන ගැටළු හඳුනා ගැනීම තුළින් ජාතික පුස්තකාලය මඟින් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සහ දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ප්‍රජාව වෙත පුස්තකාල සේවාවන් ලබාදිය යුතු ආකාරය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටද මෙම අධ්‍යයනය මඟින් අරමුණු කර ඇත. දෘශ්‍යාබාධිත සහ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම පිළිබඳව සිදු කරන මෙවැනි අධ්‍යයනයන් මීට ඉහතදී සිදු වී නොමැති බැවින් ජාතික පුස්තකාලයේ පර්යේෂණ අංශය විසින් එම ඌණ පූර්ණය සපුරාලීමට කටයුතු කර ඇත .

**ඩබ්ලිව්. සුනිල්**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පටුන

පෙරවදන iv

පටුන v

පළමු පරිච්ඡේදය

1.1 අධ්‍යයනයේ පසුබිම 1-3

1.1.1 දෘශ්‍යාබාධිතභාවය සහ ඒ ආශ්‍රිත ආබාධිත තත්ත්වයන් 1

1.1.2 දෘශ්‍යාබාධිත පුද්ගලයන් හා තොරතුරු අවශ්‍යතා 2-3

දෙවන පරිච්ඡේදය

2.1 පර්යේෂණ අරමුණු 4

2.2 පර්යේෂණ සීමා සහ ආචාර ධර්ම 4

2.3 පර්යේෂණ ක්ෂේත්‍රය 5

2.4 පර්යේෂණ ක්‍රමවේදය 5

තෙවන පරිච්ඡේදය

3.1 පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු 6

3.2 දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධ තත්ත්වයන් 7-8

3.3 තොරතුරු ලබා ගැනීමේ හා කියවීමේ/ශ්‍රවණය කිරීමේ ද්‍රව්‍ය හා පුරුදු 8-12

3.4 පරිගණක හා අන්තර්ජාල භාවිතය 13

3.5 තොරතුරු ලබාගැනීමේදී කියවීම/ශ්‍රවණය පිළිබඳ පවතින ආකල්ප 14

පස්වන පරිච්ඡේදය

5.1 නිගමන හා නිර්දේශ 15-16

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 17

ඇමුණුම 01 - සමීක්ෂණයට අදාළ ප්‍රශ්නාවලිය

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 අධ්‍යයනයේ පසුබිම

### 1.1.1 දෘශ්‍යාබාධිතභාවය සහ ඒ ආශ්‍රිත ආබාධිත තත්ත්වයන්

ලෝක සෞඛ්‍ය සංවිධානයට (2022) අනුව වර්තමානයේ ලෝක ජනගහනයෙන් බිලියන 2.2කට ආසන්න ජනගහනයක් දෘශ්‍යාබාධිතභාවය සහ ඒ ආශ්‍රිත ආබාධිත තත්ත්වයන්ට පත්ව තිබේ. එම ආබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන ජනගහනයෙන් බිලියන එකකට ආසන්න සංඛ්‍යාවක් මෙම තත්ත්වයෙන් මිදීමට හැකියාව ඇතත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර නොමැත. පෙනීමේ දුර්වලතාවයන්ට සහ ආබාධිතභාවයට ප්‍රධානම හේතු ලෙස සඳහන් කළ හැක්කේ නිවැරදි නොකළ වර්ථන දෝෂ (Uncorrected Refractive Errors) සහ ඇස්වල සුද ඇතිවීමේ (Cataracts) තත්ත්වයයි. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව පෙනීමේ දුර්වලතා ඇති සහ අන්ධභාවයට පත් වූ ජනගහනයෙන් බහුතරය වයස අවුරුදු 50ට වැඩි නමුත් පෙනීම ආශ්‍රිත ගැටලුකාරී තත්ත්වයන්ට ඕනෑම වයසක පුද්ගලයන් මුහුණ දෙනු ලබයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයෙහි ජාත්‍යන්තර රෝග වර්ගීකරණය 11 (2018) මඟින් පෙනීමේ දුර්වලතා, දුරස්ථ සහ ආසන්න පෙනීමේ දුර්වලතා ලෙස කාණ්ඩ දෙකකට වර්ග කරයි.

**දුරස්ථ පෙනීමේ දුර්වලතා**

- මෘදු-දෘශ්‍ය තීව්‍රතාවය 6/12 සිට 6/18 ට වඩා නරකය.
- මධ්‍යස්ථ-දෘශ්‍ය තීව්‍රතාවය 6/18 සිට 6/60 ට වඩා නරකය.
- දරුණු-දෘශ්‍ය තීව්‍රතාවය 6/60 සිට 3/60 ට වඩා නරකය.
- අන්ධභාවය-දෘශ්‍ය තීව්‍රතාවය 3/60 ට වඩා නරකය.

**ආසන්න දෘෂ්ටි ආබාධ**

- 40 cm දී N6 හෝ M.08 ට වඩා නරක දෘශ්‍ය තීව්‍රතාවය ආසන්නය.

මෙම දුරස්ථ පෙනීමේ දුර්වලතා සහ ආසන්න දෘෂ්ටි ආබාධ තත්ත්වයන් අනුව බිලියනයකට ආසන්න ජනගහනයක් අනාවරණය නොකර ගත් වර්තනය ආශ්‍රිත දෝෂ (මිලියන 88.4), ඇසේ සුද හේතුවෙන් (මිලියන 94), ග්ලූකෝමා (මිලියන 7.7), පාරාන්දතාවය (Corneal Opacity- මිලියන 4.2), දියවැඩියා රෝගී තත්ත්වයක් වන Diabetic Retinopathy (මිලියන 3.9) සහ වෙනත් ඇස් පෙනීමේ දුර්වලතා සහිත (මිලියන 826) රෝගී තත්ත්වයන්ගෙන් පෙළේ.

ප්‍රතිකාර ලබා ගැනීම, දෘෂ්ටි පුනරුත්ථාපනය සඳහා ප්‍රවේශය (කණ්ණාඩි හෝ සුදු සැරයටි වැනි ආධාරක නිෂ්පාදන ඇතුළුව) සහ ආබාධිත තත්ත්වයන්ගෙන් පසු වන පුද්ගලයාට ප්‍රවේශ විය නොහැකි ගොඩනැගිලි, ප්‍රවාහනය සහ තොරතුරු වෙත ප්‍රවේශවීමට ඇති හැකියාව යන විවිධ සාධක මත පදනම්ව පුද්ගලයෙකුගේ දෘෂ්ටි ආබාධ පිළිබඳ අත්දැකීම් වෙනස් වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා අනුව ශ්‍රී ලංකාව තුළ විශේෂ අවශ්‍යතා පවතින පුද්ගලයන් ප්‍රමාණය මිලියන 1.6ක් ලෙස හඳුනාගෙන තිබෙන අතර ඉන් මිලියන 1කට ආසන්න ප්‍රමාණයක් දෘශ්‍යාබාධිතභාවය සහ ඒ ආශ්‍රිත ආබාධ තත්ත්වයන්ගෙන් පෙළෙන බව තහවුරු කරගෙන තිබේ. ශ්‍රී ලංකාව තුළ ද සැලකිය යුතු ජනගහනයක් දෘශ්‍යාබාධිතභාවය හෝ ඒ ආශ්‍රිත ආබාධිත තත්ත්වයන්ට (සම්පූර්ණයෙන් අන්ධභාවයට පත් වූ, ඌන දෘෂ්ටිකත්වය, එක් ඇසක් පමණක් අන්ධභාවය ඇති පුද්ගලයන්) පත්ව තිබේ. ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ය. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් 1982 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් විවිධ සේවාවන් රැසක් මේ වන විට ආරම්භ කර ඇත.

### 1.1.2 දෘශ්‍යාබාධිත පුද්ගලයන් හා තොරතුරු අවශ්‍යතා

දෘශ්‍යාබාධිත පුද්ගලයන්හට දෘශ්‍යමාන පුද්ගලයන්ට සමාන තොරතුරු අවශ්‍යතා පැවතියත් තොරතුරු අත්පත් කර ගැනීම එතරම් පහසු නොවේ. මොවුන් විසින් තෝරා ගන්නා ලද ආකෘතියකට අදාළව තොරතුරු වලට ප්‍රවේශ වීම සිදු වේ. දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා වර්තමානයේදී පුස්තකාල සහ තොරතුරු සේවා සපයන ආයතන ඒ වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්ති, සම්මුති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

දීර්ඝ කාලයක සිට නීති මෙන්ම පරිපාලන ප්‍රතිපත්ති සකස් කිරීම සිදු වූයේ ආබාධිත බව කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරවය. සමාජය විසින් ආබාධිත පුද්ගලයන් ස්වාධීනත්වය, කුසලතා සහ අනාගත දැක්ම අවම මට්ටමක ඇති අය කොට සැලකීම මෙයට හේතුවක් විය. එම හේතු මත ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් 2013 වර්ෂයේදී මොරොක්කෝවේ මාර්කේෂ් නගරයේදී මුද්‍රිත කෘති වලට ප්‍රවේශ පහසුකම් සැලසීම පිළිබඳ මාර්කේෂ් ගිවිසුමට එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රකාරව ප්‍රකාශන අයිතිය යටතේ සුරැකෙන සියලු කෘති ආබාධිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි පරිදි සැකසිය යුතුය. ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි පිටපත් (Accessible Format Copies) මුද්‍රිත මාධ්‍ය භාවිත කරන පුද්ගලයන් හා සමාන ලෙස ආබාධිත පුද්ගලයන්ටත් එම මාධ්‍ය භාවිත කිරීමට ඉඩ ප්‍රස්ථාව සපයන ඕනෑම ආකාරයේ පිටපතක් ලබා දීමට අවශ්‍ය පහසුකම් සැලසීමට අවස්ථාව ලැබේ.

දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා ද සාමාන්‍ය ජනතාවට සේම තම අදහස්, දැනුම හුවමාරු කර ගැනීම සඳහා බ්‍රේල් (Braille) ක්‍රමය උපයෝගී කර ගැනීම සම්බන්ධව ශිජියෝ මියාමොටෝ විසින් 1991 සාහිත්‍ය වර්ෂය පාදක කර ගනිමින් "Asian / Pacific Book Development" කෘතිය මඟින් ඉදිරිපත් කර තිබේ. ඇලන් ලීච් විසින් බ්‍රේල් සම්බන්ධව මූලික හඳුන්වාදීමක් කර තිබේ. එපමණක් නොව IFLA 2020 ආසියානු සම්මන්ත්‍රණයේ විවිධ රට වල් වලින් (බංගලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, චීනය, මලයාසියාව, නේපාලය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, තායිලන්තය, වියට්නාමය) ඉදිරිපත් වූ වාර්තා හරහා ද දෘශ්‍යාබාධ සහිත ළමුන් සම්බන්ධව අධ්‍යයනය කර තිබේ. තවද විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙනුවෙන් මූලික අයිතීන් හතරක් සුරක්ෂිත කරදීමට ශ්‍රී ලංකා රජය අවධානය යොමු කර තිබේ. එම අයිතිවාසිකම් පහත පරිදිය.

1. සමානව සුරක්ෂිත වීමේ අයිතිය සහ ආබාධිත යන පදනම මත වෙනස් කොට සැලකීමෙන් වැළකීමේ භාවිතය
2. ප්‍රවේශතාව සහ පෞද්ගලික සංචලතාව සඳහා ඇති අයිතිය
3. අධ්‍යාපනය, සෞඛ්‍ය, ආරක්ෂණය සහ රැකියාව සඳහා ඇති අයිතිය
4. දේශපාලන සහ පොදු ජන ජීවිතය සඳහා සහභාගී වීමේ අයිතිය

දෘශ්‍යාබාධිත පුද්ගලයන් සහ පාසැල් සිසුන් විසින් නිරන්තරයෙන්ම විවිධ කියවීමේ සහ ශ්‍රවණය කිරීමේ ආකෘති භාවිත කරයි. උදාහරණ ලෙස බ්‍රේල් (Braille), ඩේසි හා වෙනත් කථන පොත්, විශාල අකුරු සහිත මුද්‍රණ, ඉතා විශාල අකුරු සහිත මුද්‍රණ, E-Books සහ අන්තර්ජාලය දැක්විය හැකිය. එමෙන්ම දෘශ්‍යාබාධිත පුද්ගලයන් සහ විශේෂයෙන්ම දෘශ්‍යාබාධිත පාසැල් සිසුන් වෙත ද පුස්තකාල මඟින් අවශ්‍ය පහසුකම් හා සේවා සපයා දෙනු ලැබේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, මහජන පුස්තකාල, පාසැල් පුස්තකාල සහ වෙනත් අදාළ ආයතනික පුස්තකාල ආශ්‍රයෙන් දෘශ්‍යාබාධිත පාඨකයන් වෙනුවෙන් පුස්තකාල පහසුකම් හා සේවා සපයනු ලැබේ.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි පාඨක සේවා අංශය මඟින් දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා පුස්තකාල සේවා සැපයීමේ කටයුතු සිදු කරයි. තවද ජාතික පුස්තකාලයෙහි කථන පුස්තකාල අංශයක් ඇති කිරීම, සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් බ්‍රේල් පොත් සහ විශාල අකුරින් මුද්‍රිත පොත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා පුස්තකාල සේවා සැපයීමේ සේවා තවදුරටත් පුළුල් කරමින් දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා වන පුස්තකාල පහසුකම් පිළිබඳ අධ්‍යයනවල යෙදීම, ඔවුන් වෙනුවෙන් සේවා සම්පාදනය සඳහා කමිටු පත්කර ගැනීම, දේශීය

වශයෙන් ප්‍රකාශිත බ්‍රේල් පොත්, කථන පොත් සහ විශාල අකුරින් මුද්‍රිත පොත්වල එකතුවක් ගොඩනැගීම, විදේශීය රටවල ප්‍රකාශයට පත්වී ඇති බ්‍රේල් විමර්ශන ග්‍රන්ථ එකතුවක් ගොඩනැගීම, මෙරට දෘශ්‍යාබාධිතයන් සඳහා වන පුස්තකාලවල ඇති විශේෂ ස්වරූපයේ ද්‍රව්‍ය එකතු පිළිබඳ තොරතුරු ඇතුළත් ඒකාබද්ධ සූචියක් සම්පාදනය කිරීම සහ සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් බ්‍රේල් පොත් සහ විශාල අකුරින් යුත් පොත් නිෂ්පාදනයට පියවර ගැනීමට යෝජනා වී තිබේ.

දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් අවශ්‍ය සේවා සැපයීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සමාජ සේවා දෙපාර්තමේන්තුව හා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු, ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික සභාව වැනි ආයතන මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබයි.

# දෙවන පරිච්ඡේදය

# ක්‍රමවේදය

## 2.1 පර්යේෂණ අරමුණු

**ප්‍රධාන අරමුණ**

- දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම.

**උප අරමුණු**

- දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා මොනවා ද යන්න හඳුනා ගැනීම.
- තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීමට භාවිත කරනු ලබන කියවීමේ/ශ්‍රවණය කිරීමේ ආකෘති හා ක්‍රම හඳුනා ගැනීම.
- දෘශ්‍යාබාධිත පාඨකයින්ගේ කියවීම් රුචිකත්වය සහ ඒ පිළිබඳ ආකල්ප අධ්‍යයනය කිරීම.
- දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමේදී මතුවන ගැටලු හඳුනා ගැනීම.
- පර්යේෂණ සොයා ගැනීම් ඇසුරින් නිර්දේශ ඉදිරිපත් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීම.

## 2.2 පර්යේෂණ සීමා සහ ආචාරධර්ම

- දෘශ්‍යාබාධිතභාවය සහ ඒ සම්බන්ධ ආබාධිත තත්ත්වයට පත් වූ පුද්ගලයන් අතිශය සංවේදී පුද්ගල කොට්ඨාශයක් වීම නිසා තොරතුරු ලබා ගැනීමේ සීමා පැවතීම.

- මෙම ප්‍රජාව සම්බන්ධයෙන්, වගකිව යුතු රාජ්‍ය ආයතන සතුව නිවැරදි සංඛ්‍යාත්මක දත්ත පදනම් පවත්වා නොගැනීම හා යාවත්කාලීන නොවීම.

- දෘශ්‍යාබාධිත ප්‍රජාව සම්බන්ධව කටයුතු කරන හා සම්පත් දායකත්වය සපයන රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන ප්‍රමාණය සීමා වීම සහ ඒ සම්බන්ධව කටයුතු කිරීමේ අපහසුතාවය.

- ශ්‍රී ලංකාව සම්පූර්ණ වශයෙන් ආවරණය වන පරිදි දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ තොරතුරු ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගතවීම සහ ප්‍රායෝගික දුෂ්කරතා මතුවීම.

## 2.3 පර්යේෂණ ක්ෂේත්‍රය

දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සම්බන්ධයෙන් සිදු කරනු ලබන මෙම අධ්‍යයනය තුළදී මූලික වශයෙන් පර්යේෂණ ක්ෂේත්‍රය තෝරා ගැනීම වැදගත් කොට සැලකිය හැකිය. ප්‍රමාණවත් සංඛ්‍යාත්මක දත්ත නොමැතිකම සහ ප්‍රායෝගික දුෂ්කරතා මත පර්යේෂණ ක්ෂේත්‍රය යම් යම් සීමාවීම් වලට ලක් වී තිබේ. මුළු රටම ආවරණය වන පරිදි මෙවැනි පර්යේෂණයන් සිදු කිරීම අපහසු බැවින් නියමු අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය රත්මලාන අන්ධ විද්‍යාලය සහ අන්ධ ජන සේවා මණ්ඩලයෙහි සහාය ඇතිව දෘශ්‍යාබාධිත හා ඒ ආශ්‍රිත ආබාධිත පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කේන්ද්‍රකර ගනිමින් පර්යේෂණ ක්ෂේත්‍රය තෝරාගෙන තිබේ.

## 2.4 පර්යේෂණ ක්‍රමවේදය


මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර ක්‍රමවේදය (Mixed Method) භාවිත කරන ලදී. ඒ අනුව ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත යන දෙආකාරයෙන් දත්ත රැස් කරන ලද අතර ප්‍රශ්නාවලි ක්‍රමය හරහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. අධ්‍යයනයට අනුව දෘශ්‍යාබාධිත සහ ඒ සම්බන්ධිත ආබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 90 දෙනෙකු නියැදිය ලෙස තෝරාගන්නා ලදී. එහිදී සම්පූර්ණ අන්ධභාවයට ලක්ව හෝ ප්‍රශ්නාවලියට පිළිතුරු ලබාදිය නොහැකි මට්ටමේ සිටින පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු වාචිකව ලබා ගෙන සම්පූර්ණ කරන ලදී. දත්ත ප්‍රමාණාත්මක සහ ගුණාත්මකව විශ්ලේෂණය කළ අතර ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයේදී SPSS දත්ත පදනම භාවිත කළ අතර විශ්ලේෂණය කළ දත්ත වගු සහ ප්‍රස්තාර අනුසාරයෙන් ඉදිරිපත් කර ඇත.

# තෙවන පරිච්ඡේදය

## දත්ත විශ්ලේෂණය

### 3.1 පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

ප්‍රස්තාර අංක 01: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ශිෂ්‍යයන්ගේ ව්‍යාප්තිය




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දක්වන ලද පාසැල් සිසුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව සලකා බැලීමේදී හඳුනාගත හැකි වන්නේ සමස්ත සිසුන් 90 අතරින් 51% ක් ස්ත්‍රී වන අතර සිසුන් 49% ක් පුරුෂ පක්ෂය වන බවයි.

අධ්‍යයනයට භාජනය වූ සිසුන්ගේ වයස් මට්ටම් දෙස අවධානය යොමු කිරීමේදී මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රධාන වයස් කාණ්ඩ 02ක් ලෙස ගෙන වයස අවු. 11-15 අතර සහ අවු. 16 -20 ලෙස කාණ්ඩ ගත කරන ලදී. ඒ අනුව වයස අවු. 11-15 අතර වයස් කාණ්ඩයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 57% ක ප්‍රතිශතයක් නියෝජනය වේ. වයස අවු. 16-20 වයස් කාණ්ඩයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රතිශතය 43%කි.

මෙම සමීක්ෂණය හරහා ඒ ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අධ්‍යාපනය හදාරනු ලබන ශ්‍රේණිය පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී. විශේෂයෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පවතින ආබාධිත තත්ත්වය හේතුවෙන් ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඔවුනොවුන්ගේ වයස් මට්ටම්වලට වඩා ඉහළ හෝ පහළ ශ්‍රේණි වල අධ්‍යාපනය හදාරන ස්වභාවයක් දක ගත හැකිය. ඒ අනුව ඔවුනොවුන්ගේ වයස් මට්ටම් වලට සාපේක්ෂව අධ්‍යාපනය හදාරනු ලබන ශ්‍රේණිවල වෙනස්වීමක් දකගත හැකි වේ. ප්‍රතිචාරිකයන් 90 අතරින් බහුතරයක් 6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන අතර ඉතිරි පිරිස 11, 12, 13 යන ශ්‍රේණිවල අධ්‍යාපනය ලබයි.

### 3.2 දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධ තත්ත්වයන්

මෙම සමීක්ෂණය හරහා ඒ ඒ පාසැල් සිසුන්ගේ දෘශ්‍යාබාධිතභාවය සම්බන්ධ විවිධ තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඒ අනුව දෘශ්‍යාබාධිතභාවය ආශ්‍රිත ආබාධිත තත්ත්වයකට පත්වීමේ හේතු පිළිබඳ විමසා බලන ලදී. උපතින්ම දෘශ්‍යාබාධිතභාවයට පත්වීම, හදිසි අනතුරු/ගැටුම් හේතුවෙන් ඇති වූ තත්ත්වයන්, වෙනත් කායික රෝගී තත්ත්වයන්, උපතේ සිට කාලයත් සමඟ ස්වාභාවිකව හා වෙනත් හේතු තුළින් ද යම් පුද්ගලයෙකු දෘශ්‍යාභාධිතභාවයට පත්විය හැකිය.

වගු අංක 01 : දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධ තත්ත්වයන්

| හේතුව | ප්‍රතිශතය (%) |
|---|---|
| උපතින්ම | 55.4% |
| හදිසි අනතුරු/ගැටුම් | 7.8% |
| වෙනත් කායික රෝග | 17.4% |
| උපතේ සිට කාලයත් සමඟ | 15.6% |
| වෙනත් | 3.8% |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

මෙහිදී අධ්‍යයනයට භාජනය කරන ලද පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 90 අතරින් 55.4%ක ප්‍රතිශතයක් උපතේදීම දෘශ්‍යාබාධිතභාවයට පත්ව තිබේ. උපතේ සිට කාලයත් සමඟ ස්වාභාවිකව දෘශ්‍යාබාධිතභාවයට පත්ව ඇති ප්‍රමාණය 15.6%කි. එමෙන්ම 17.4%ක ප්‍රතිශතයක් වෙනත් කායික රෝගී තත්ත්වයන් හේතුවෙන් ද 7.8%ක් හදිසි අනතුරු/ගැටුම් හේතුවෙන් ද දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්ව තිබේ. මෙම හේතුවලට අමතරව වෙනත් හේතු ලෙස ප්‍රතිචාරිකයන් විසින් සඳහන් කර තිබෙන්නේ ලේ ඥාතිත්වය මත ද දෘශ්‍යාබාධිතභාවයට පත්ව ඇති බවයි.

මෙම අධ්‍යයනය ඔස්සේ එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධව දක්නට ලැබෙන රෝගී තත්ත්වයන් පිළිබඳව ද තොරතුරු ලබා ගන්නා ලදී.

වගු අංක 02 : දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධව ඇති රෝගී තත්ත්වයන්

| රෝගී ස්වභාවය | ප්‍රතිශතය |
|---|---|
| පූර්ණ අන්ධභාවයට පත්වූ | 52.2% |
| එක් ඇසක් පමණක් අන්ධභාවයට පත්වූ | 16.7% |
| දෘෂ්ටි ඌණතාවයන් ඇති | 28.9% |
| නිශ්චිත පිළිතුරක් සඳහන් කර නොමැති | 2.2% |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

වගු අංක 02 අනුව පූර්ණ අන්ධභාවයට පත් වූ, එක් ඇසක් පමණක් අන්ධභාවයට පත්වූ, දෘෂ්ටි ඌණතා ඇති යන ආබාධිත තත්වයන් හා වෙනත් හේතු පිළිබඳව සලකා බලන ලදී.

සමස්ත ප්‍රතිචාරිකයින් අතුරින් 52.2%ක් පූර්ණ අන්ධභාවයට පත්ව තිබේ. 16.7%ක පාසැල් සිසුන් පිරිසක් එක් ඇසක් පමණක් අන්ධභාවයට පත්ව ඇති අතර 28.9%කට ආසන්න ප්‍රතිශතයක් විවිධ දෘෂ්ටි ඌණතා පවතින තත්ත්වයට අයත් වේ.

එමෙන්ම ඉහත සඳහන් කළ දෘශ්‍යාබාධිත තත්ත්වය හා ඒ සම්බන්ධ තත්ත්වයන් අවම කර ගැනීම සඳහා උපැස් භාවිත කිරීමට සිදු වේ. සමීක්ෂණයෙහි ප්‍රතිචාර ලබාදුන් ප්‍රමාණයෙන් 25.6%ක් උපැස් භාවිත කිරීමක් සිදුකරන බව අනාවරණය විය. ඊට අමතරව දෘශ්‍යාබාධිත තත්ත්වය හේතුවෙන් කිසියම් ආධාරක ක්‍රමෝපායන් භාවිත කිරීම පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කරන ලදී. ඒ අතරින් බහුතර සිසුන් ප්‍රමාණයක් එනම් 60%ක පිරිසක් කිසියම් ආධාරක ක්‍රමෝපායක් භාවිත කරන බව අනාවරණය වේ. එසේ ජංගම ආධාරක ක්‍රමෝපායන් වශයෙන් භාවිත කරන පිරිසෙන් 35.7%ක් සුදු සැරයටිය භාවිත කරයි. ඊට අමතරව තමන්ගේ කර්තව්‍යයන් සිදු කර ගැනීමට ආධාරකයන් වශයෙන් උපකාරක සහායකයෙකුගේ සහාය ලබා ගනී. එම ප්‍රමාණය 24.3% කි.

### 3.3 තොරතුරු ලබා ගැනීමේ හා කියවීමේ /ශ්‍රවණය කිරීමේ ද්‍රව්‍ය හා පුරුදු

දෘශ්‍යාබාධිත පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් තම විවිධ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමේ හා කියවීමේ/ශ්‍රවණය කිරීමේ පුරුදු අනුගමනය කරයි. ඒ අනුව අධ්‍යාපන අවශ්‍යතා, සාමාන්‍ය දැනුම ලබා ගැනීම, වෙනත් තොරතුරු ලබා ගැනීම, සතුට/විනෝදාස්වාදය යනාදී අවශ්‍යතා වෙනුවෙන් කියවීමේ හා ශ්‍රවණය කිරීම සඳහා විවිධ ද්‍රව්‍ය භාවිතයට පුරුදු වීම කෙරෙහි කැමැත්තක් දක්වයි.

අධ්‍යයනයට භාජනය කරන ලද පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් වැඩි පිරිසක් එනම් 73.3%ක් තම අධ්‍යාපන අවශ්‍යතා වෙනුවෙන් කියවීමේ/ශ්‍රවණය කිරීමේ ද්‍රව්‍ය භාවිතයට පුරුදුවීම කෙරෙහි අවධානය යොමු කර තිබේ. ඊට අමතරව 11.1%ක ශිෂ්‍යයන් පිරිසක් සාමාන්‍ය දැනුම ලබා ගැනීම වෙනුවෙන්, 5.6%ක ආසන්න අගයක් වෙනත් තොරතුරු හා සේවා ලබා ගැනීම මෙන්ම 4.4%කට පිරිසක් සතුට/විනෝදාස්වාදය ලබා ගැනීමේ අරමුණින් කියවීමෙහි/ශ්‍රවණය කිරීමෙහි ද්‍රව්‍ය භාවිතයට හා පුරුදු ඇති කර ගැනීමට පෙළඹී තිබෙන බව අනාවරණය වේ.

වගු අංක 03 : කියවීම /ශ්‍රවණය සඳහා කැමැත්තක් දැක්වීමට හේතු

| හේතුව | ප්‍රතිශතය (%) |
|---|---|
| අධ්‍යාපන අවශ්‍යතා සඳහා | 73.3% |
| සාමාන්‍ය දැනුම ලබා ගැනීම සඳහා | 11.1% |
| වෙනත් තොරතුරු හා සේවා ලබා ගැනීම සඳහා | 5.6% |
| සතුට විනෝදාස්වාදය සඳහා | 4.4% |
| නිශ්චිත පිළිතුරක් ලබා නොදුන් | 5.6% |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත


පාසැල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් තොරතුරු ලබා ගැනීමේදී හා විමර්ශනය කිරීමේදී පාසැල් පුස්තකාලය භාවිත කරනු ලබන කාල සීමාව පිළිබඳව මෙම අධ්‍යයනය හරහා අවධානය යොමු කරන ලදී. ඒ අනුව බහුතර ප්‍රතිචාරිකයන් පිරිසක් පෙන්වා දී තිබෙන්නේ තමන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේදී සතියකට වරක් පාසැල් පුස්තකාලය පරිහරණය කරනු ලබන බවයි.

එම අගය මුළු ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් 66.5%කි. ඊට අමතරව 20%කට ආසන්න ප්‍රතිශතයක් දිනපතා පාසැල් පුස්තකාලය භාවිත කරන අතර 13.5%ක පිරිසක් සති 02කට වරක් පුස්තකාලය පරිහරණය කරනු ලබන බව අනාවරණය වේ.

මෙම අධ්‍යයනය ඔස්සේ තොරතුරු වෙත ප්‍රවේශ වීමේදී පාසැල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් භාවිත කරනු ලබන කියවීමේ ආකෘති කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. විශේෂයෙන්ම මෙම පාසැල් ප්‍රජාව ඉතා සංවේදී කොට්ඨාශයක් වන බැවින් හා තොරතුරු ගවේෂණයේදී සාමාන්‍ය පාඨකයන්/ශිෂ්‍යයන් භාවිත කරනු ලබන කියවීමේ ආකෘතිවලට වඩා බොහෝ සෙයින් වෙනස් ඔවුන් වෙනුවෙන්ම නිර්මාණය කරන ලද කියවීමේ ආකෘති භාවිතය කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වනු ලබයි.

බ්‍රේල්, විශාල අකුරු සහිත මුද්‍රණ, ඉතා විශාල අකුරු සහිත මුද්‍රණ, කථන පොත්, ඩේසි කථන පොත්, ඉලෙක්ට්‍රොනික පොත් හා අන්තර්ජාලය යන කියවීමේ ආකෘති භාවිත කිරීමේ ස්වභාවය මෙහිදී සැලකිල්ලට ගනු ලබයි. බහුතර ශිෂ්‍ය පිරිසක් එනම් 83.3%ක ප්‍රමාණයක් බ්‍රේල් (Braille) මාධ්‍ය තම කියවීමේ මූලික ආකෘතිය ලෙස භාවිත කරයි. ඊට අමතරව සමස්ත ශිෂ්‍ය ප්‍රජාව අතුරින් 5.6%ක ප්‍රතිශතයක් විශාල අකුරු සහිත මුද්‍රණ (Larage print) භාවිත කරයි. පිළිවෙලින් 6.4%ක් කථන පොත් (Audio Books on CD/DVD), 3.2%ක් අන්තර්ජාලය ඔස්සේ හා 1.5%ක් කථන පොත් සහිත කැසට් පරිහරණය කරනු ලබයි. මෙහිදී දැකගත හැකි සුවිශේෂීත්වයක් වන්නේ සාමාන්‍ය ශිෂ්‍ය ප්‍රජාවට මෙන් මෙම සිසුන් හට අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව අවම මට්ටමක පවතින බවයි. ඉහත සඳහන් කළ ආකෘති අතරින් ශිෂ්‍යයන් විසින් වැඩියෙන්ම කැමැත්තක් දක්වන හා වැඩියෙන් භාවිත කරනු ලබන ආකෘති කෙරෙහි පිළිබඳව මෙම අධ්‍යයනය ඔස්සේ සලකා බලනු ලැබිණි. ඒ අතරින් බ්‍රේල් මාධ්‍යයෙන් 64%ක ප්‍රතිශතයක් තම තොරතුරු ලබා ගැනීමට වැඩියෙන් කැමැත්තක් දක්වන හා භාවිත කරනු ලබන මාධ්‍යය ලෙස යොදා ගන්නා බව අනාවරණය වේ. ඊට අමතරව ඩේසි කථන පොත් භාවිත කිරීමට කැමැත්තක් දක්වන ප්‍රතිශතය 36%ක් බව පෙන්වා දී ඇත.

ප්‍රස්තාර අංක 02 : කියවීමේ ආකෘති භාවිත කිරීමේ හේතු





මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

විශේෂයෙන්ම තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුව මත 51%ක බහුතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණයක් විසින් ඉහත ආකෘති භාවිත කිරීමට පෙළඹී ඇත. ඊට අමතරව උපකරණයේ/ආකෘතියේ ප්‍රමාණය මත පදනම්ව සිසුන් 38%ක ප්‍රමාණයක් ඉහත ආකෘති භාවිත කරයි. ඊට අමතරව භාවිතයට ඇති පහසුව (12%) සහ වියදම අවම බව (7%) යන සාධක මත පදනම්ව ඉහත සඳහන් කරන ලද කියවීමේ ආකෘති භාවිත කිරීමට පෙළඹී ඇත.

තොරතුරු වෙත ප්‍රවේශ වීමේදී කියවීම් හා ශ්‍රවණය ආශ්‍රිත ද්‍රව්‍ය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව පවුලේ සාමාජිකයන් විසින් පසුගිය මාසයක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිලදී ගත් ස්වභාවය පිළිබඳව අවධානය යොමු කරන ලදී.


ප්‍රස්තාර අංක 03 : පවුලේ සාමාජිකයන් විසින් පසුගිය මාසයක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිලදී ගත් ස්වභාවය




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

ශිෂ්‍ය/ශිෂ්‍යාවන් 31%කට අයත් ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ පවුලේ සාමාජිකයන් විසින් පසුගිය මාසයක කාලය තුළ කියවීම් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණ ද 61%ක ශිෂ්‍ය/ශිෂ්‍යාවන් නියෝජනය කරනු ලබන පවුලේ සාමාජිකයින් විසින් කියවීම් හා ශ්‍රවණය ආශ්‍රිත ද්‍රව්‍ය ලබාගැනීම් සිදු කර නොමැති ස්වභාවයක් අනාවරණය වේ. එම කාල සීමාව තුළ වැඩි වශයෙන් පොත් හා පත්තර පවුලේ සාමාජිකයින් විසින් කියවීම් ද්‍රව්‍ය ලෙස මිලදී ගෙන තිබේ. එසේ බහුතර ශිෂ්‍ය සංඛ්‍යාවක් විසින් කියවීම් හා ශ්‍රවණය ආශ්‍රිත ද්‍රව්‍ය මිලදී නොගත් හේතු ලෙස හඳුනාගත හැකි වන්නේ කියවීම් ද්‍රව්‍ය මිලදී ගැනීමට විශේෂිත අවශ්‍යතාවක් නොමැති බව හා ප්‍රමාණවත් ලෙස ඒ වෙනුවෙන් පහසුකම් නොමැති බවයි. දෘශ්‍යාබාධිත තත්ත්වයන් සහිත පාසැල් සිසුන් විසින් තමන්ට අවශ්‍ය කියවීම් ද්‍රව්‍ය තෝරා ගන්නා ආකාරය පිළිබඳව අවධානය යොමු කළ අතර එහිදී අනාවරණය වූයේ පාසැලේ ගුරුවරුන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ උපදෙස් මත තමන්ට අවශ්‍ය කියවීම් ද්‍රව්‍ය තෝරා ගන්නා අතර කියවීමේ රුචිකත්වය මත පදනම්ව ද කියවීම් හා ශ්‍රවණය ආශ්‍රිත ද්‍රව්‍ය තෝරාගනු ලබයි.

ප්‍රස්තාර අංක 04 : ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ ජන මාධ්‍ය භාවිතය




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත


මෙම ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ ජන මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ලබා ගත් දත්තවලට අනුව අනාවරණය වන්නේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් 86%ක් ජන මාධ්‍ය භාවිත කරන අතර එම පිරිසෙන් බහුතරයක් රූපවාහිනී මාධ්‍යය භාවිත කරයි. එම ප්‍රමාණය 74% කි. ඊට අමතරව ගුවන් විදුලිය හා පුවත් පත් ද භාවිත කරනු ලබයි. දෘශ්‍යාබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් කියවීම සඳහා බ්‍රේල් මාධ්‍යය (Braille) හෝ ශ්‍රවණය වෙනුවෙන් කථන මාධ්‍ය පුවත් පත් (Talking NewsPapers) භාවිත කිරීම සම්බන්ධව අවධානය යොමු කළ අතර එහිදී අනාවරණය වූයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 44%ක් තම තොරතුරු අවශ්‍යතා සපුරාගැනීම වෙනුවෙන් බ්‍රේල් හෝ කථන මාධ්‍යය පුවත් පත් භාවිත කරන බවයි. ඒ අතරින් කියවීමට හෝ ශ්‍රවණ මාධ්‍ය ආශ්‍රයෙන් භාවිතයට වඩාත් කැමති පුවත් පත් ලෙස විජය, ලංකාදීප සහ මිහිර පුවත් පත් භාවිතයට ගන්නා බව ද අනාවරණය වේ.

## 3.4. පරිගණක හා අන්තර්ජාල භාවිතය

දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරාලීමේදී මුහුණපානු ලබන අභියෝග පිළිබඳ සිදුකළ මෙම සමීක්ෂණය ඔස්සේ පාසැල් සිසුන්ගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා පරිගණක/ඩෙක්ස්ටොප්/ලැප්ටොප්/ටැබ් භාවිතය පිළිබඳව විමසා බැලූ අතර 55%ක ප්‍රතිචාරිකයන් ප්‍රමාණයක් පරිගණක/ඩෙක්ස්ටොප්/ලැප්ටොප් සහ ටැබ් භාවිත කරන අතර 45%ක ප්‍රතිශතයක් එම කිසිඳු මෙවලමක් භාවිත නොකරයි.

ප්‍රස්තාර අංක 05 : තොරතුරු ලබා ගැනීමේදී පරිගණක භාවිතය හා ඒ සම්බන්ධ සංකල්ප පිළිබඳව පාසැල් සිසුන්ගේ පවතින අවබෝධය




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත

තොරතුරු ලබා ගැනීමේදී පරිගණක භාවිතය හා ඒ සම්බන්ධ සංකල්ප (features) පිළිබඳව මෙම පාසැල් සිසුන්ගේ පවතින අවබෝධය 48%ක සාමාන්‍යය ප්‍රමාණයක පවතී. තවද කැපීපෙනෙන තත්වයක් වන්නේ පරිගණක භාවිතය හා ඒ සම්බන්ධ සංකල්ප පිළිබඳව සිසුන් 37%කට ආසන්න පිරිසක් නිසි අවබෝධයකින් යුක්ත නොවීමයි. අධ්‍යාපන කටයුතු සිදු කිරීමට/ප්‍රවේශවීමට නව තාක්ෂණය සහ පරිගණක භාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට හඳුනාගත හැකි වන්නේ 37%ක පාසැල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් ප්‍රමාණයක් විසින් තමන්ටම අයත් පරිගණකයක් භාවිත කරන බවයි. පරිගණක භාවිත කිරීම/ප්‍රවේශවීම සඳහා පවතින අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන විට අනාවරණය වන්නේ අධ්‍යාපනික කටයුතු වලට අදාළ තොරතුරු යාවත්කාලීන කරගැනීමට සහ විෂය සමගාමී තොරතුරු වලට අමතරව වෙනත් තොරතුරු/දැනුම ලබාගැනීම වෙනුවෙන් මූලිකවම පරිගණක භාවිත කිරීම සිදු කරන බවයි.

තවද පරිගණක භාවිත නොකිරීමට මූලික වන හේතු ලෙස පරිගණකයක් මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍යමය අපහසුතා පැවතීම, පරිගණක භාවිතය හා ඒ ආශ්‍රිත සංකල්පය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීම සහ පරිගණක භාවිතය පිළිබඳව කැමැත්තක්/අවශ්‍යතාවක් නොමැතිවීම යන කරුණු ප්‍රමුඛවන බව පෙන්වා දී ඇත. එමෙන්ම පාසැල තුළදී අන්තර්ජාලය භාවිත කිරීමේදී/ප්‍රවේශවීමේදී මෙම පාසැල් ශිෂ්‍යයන් මුහුණපානු ලබන ප්‍රධානතම ගැටලු ලෙස තොරතුරු තාක්ෂණය සම්බන්ධ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, දුර්වල අන්තර්ජාල සබඳතාවයන් පවත්වාගෙන යාම සහ පාසැල් පුස්තකාලය තුළ නව තාක්ෂණික පහසුකම් නොපැවතීම සහ මේ සම්බන්ධයෙන් පවතින දැනුවත්භාවය අවම වීම යන කරුණු මත පාසල තුළදී අන්තර්ජාලය භාවිත කිරීමේදී/ප්‍රවේශවීමේදී මෙම පාසැල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් ගැටලුවලට මුහුණ දෙනු ලබන බව පැහැදිලි වේ.

### 3.5. තොරතුරු ලබාගැනීමේදී කියවීම/ශ්‍රවණය පිළිබඳ පවතින ආකල්ප

දෘශ්‍යාබාධිත තත්ත්වයන්ගෙන් පෙළෙන පාසැල් සිසුන් තොරතුරු ලබාගැනීමේදී කියවීම හා ශ්‍රවණය පිළිබඳ පවතින ආකල්ප සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලදී. ඒ අනුව අනාවරණය වූයේ පාසැල් සිසුන් (53%)ක් අධ්‍යාපනික අවශ්‍යතා සඳහාත් කියවීමට දක්වන රුචිකත්වය මතත් (18%) තොරතුරු වෙත ගවේෂණය සඳහා යොමු වී ඇති බවයි.

තවද පාසැල් අධ්‍යාපන කටයුතු වලදී මුද්‍රිත සම්පත්/මාධ්‍යය භාවිතයට වඩා ශ්‍රවණය ආශ්‍රිත සම්පත් /මාධ්‍යය වලට මෙම පාසැල් සිසුන් විසින් වැඩි කැමැත්තක් දක්වයි. එය 64%ක ප්‍රතිශතයකි. එසේ කැමැත්තක් දැක්වීමට මූලික වන හේතු ලෙස අනාවරණය වන්නේ ශ්‍රවණය ආශ්‍රිත සම්පත් භාවිතයට ඇති පහසුව, විශාල තොරතුරු පරාසයකට ප්‍රවේශ වීමට ඇති හැකියාව යන කරුණුය.

දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා අනුව ඒවා සපුරා ගැනීමේදී ගැටලු කිහිපයකට මුහුණපෑමට සිදු වන බව අනාවරණය වේ. පුස්තකාලය තුළ සහ පාසැල තුළ ප්‍රමාණවත් කියවීම් ද්‍රව්‍ය/ශ්‍රවණය කිරීමේ ද්‍රව්‍ය නොතිබීම (40%), කියවීමේ/ශ්‍රවණය කිරීමේ තාක්ෂණික පහසුකම් අවම වීම (20%), මූල්‍යමය දුෂ්කරතා (18%), තොරතුරු ලබාගැනීමට අවශ්‍ය මඟ පෙන්වන්නෙක් හෝ සහායකයෙක් නොමැති වීම (15%) සහ භාෂාමය බාධක පැවතීම (7%) යන ගැටලුවලට මුහුණ දීමට සිදුව ඇති බව අනාවරණය වේ.

මෙම ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා ගැනීමට/අවම කරගැනීමට පාසැල් ශිෂ්‍යයන් වශයෙන් ඔවුන් විසින් පහත සඳහන් අදහස් සහ යෝජනා ඉදිරිපත් කර තිබේ.

- ප්‍රමාණවත් පරිදි තොරතුරු ලබාගැනීමට බ්‍රේල් ක්‍රමය තවදුරටත් දියුණු විය යුතු බව.
- ප්‍රවේශය වඩාත් පහසු විය හැකි පරිදි පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
- තොරතුරු වෙත ප්‍රවේශවීම සඳහා නව තාක්ෂණය භාවිත කිරීමට අවශ්‍ය දැනුම හා අවබෝධය ලබාදීම.
- පාසැල් පුස්තකාලවල පහසුකම් සංවර්ධනය කිරීම.
- තොරතුරු වෙත ප්‍රවේශවීමේදී කියවීම හා ශ්‍රවණය ආශ්‍රිත ද්‍රව්‍ය ලබාගැනීම අත්‍යාවශ්‍යය. ඒ වෙනුවෙන් පවුලේ සාමාජිකයන් විසින් අවශ්‍ය මගපෙන්වීම ලබා දීම.
- ශ්‍රව්‍ය පොත් සහ ඒ ආශ්‍රිත කියවීම් ද්‍රව්‍ය මහජන පුස්තකාල වෙත ලබා දීම.
- විභාගවලට පෙනීසිටීමේදී ඒ සඳහා පහසු ක්‍රමවේදයන් සකස් කිරීම.
- කියවීමේ පුරුදු වැඩ සටහන් සංවිධානය කිරීම.
- පුහුණු ගුරුවරුන් ප්‍රමාණවත් නොවීම.

# පස්වන පරිච්ඡේදය

## නිගමන හා නිර්දේශ

දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනය ඔස්සේ වර්තමානය වන විට මෙම සිසුන් තොරතුරු ලබා ගැනීමේ හා කියවීමේ/ශ්‍රවණය කිරීමේ පුරුදු, තොරතුරු වෙත ප්‍රවේශ භාවිත කරන කියවීමේ ආකෘති හා කියවීම් ද්‍රව්‍ය තෝරා ගන්නා ආකාරය, තොරතුරු ලබා ගැනීමේදී ජනමාධ්‍ය භාවිතය, කියවීමට හා ශ්‍රවණයට කථන මාධ්‍යය පුවත්පත් භාවිතය, අන්තර්ජාලය භාවිතය, පරිගණක භාවිතය හා ඒ සම්බන්ධ සංකල්ප පිළිබඳ අවබෝධය, පරිගණක ආශ්‍රිතව සම්පත් භාවිත කිරීමට /ප්‍රවේශවීම සඳහා අරමුණු, තොරතුරු ලබා ගැනීමේදී කියවීම/ශ්‍රවණය පිළිබඳ ආකල්ප සහ තොරතුරු ලබා ගැනීමේදී හා ඒ සඳහා ප්‍රවේශ වීමේදී මූණපාන ගැටලු හා බාධක සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීමට හැකි විය. එම අනාවරණයන් අනුව අනාගත සැලසුම් හා ක්‍රමවේදයන් සංවර්ධනය කිරීමේ අරමුණින් සමීක්ෂණය හරහා හෙළි කරගත් තොරතුරු මඟින් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළ හැක.

- අන්ධ හා දෘශ්‍යාබාධිත ශිෂ්‍යයන් හා පාඨක ප්‍රජාව වෙනුවෙන් පුස්තකාල සේවාවන් ලබා දෙන ආකාරය පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කිරීම.

- අන්ධ හා දෘශ්‍යාබාධිත ප්‍රජාව සඳහා කටයුතු කරන ආයතන වල පවතින පුස්තකාල එකතු පිළිබඳ තොරතුරු ඇතුළත් ජාතික ඒකාබද්ධ සූචියක් සම්පාදනය කිරීම.

- අන්ධ හා දෘශ්‍යාබාධිත පාසල් සිසුන් වෙනුවෙන් සහ එම ප්‍රජාව සඳහා පුස්තකාල සේවාවන් සංවිධානය කිරීමට මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ වූ ආයතන වල නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීම

- මෙම ප්‍රජාව වෙනුවෙන් සහ ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා, ආකල්ප හඳුනාගැනීම වෙනුවෙන් තව දුරටත් පර්යේෂණ සිදු කිරීම සහ එම පර්යේෂණ වාර්තා ඇසුරින් ප්‍රතිපත්තිමය තීරණ වලට එළැඹීම.

- අන්ධ සහ දෘශ්‍යාබාධිත ප්‍රජාවට භාවිත කල හැකි විමර්ශන ග්‍රන්ථ එකතුවක් අත්පත් කර ගැනීම. ඒ ඔස්සේ ග්‍රන්ථ මිලදී ගැනීම, පරිත්‍යාග, හුවමාරු යන ක්‍රම මඟින් එකතුව ගොඩනැගීම.

- බ්‍රේල්, කථන පොත්, ලොකු අකුරින් මුද්‍රිත පොත්, ශ්‍රව්‍ය, කැසට් පට ආදී විශේෂ ස්වරූපයේ ද්‍රව්‍යවලින් සමන්විතව පාසල් පුස්තකාලය තුළ මෙන්ම ජාතික පුස්තකාලය ප්‍රමුඛ පුස්තකාල පද්ධතිය ඔස්සේ එකතුවක් ගොඩනැගීම.

- මහජන පුස්තකාල කාර්යමණ්ඩලය සහ දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා පුස්තකාල සේවා සංවිධානය කිරීම සහ තොරතුරු සැපයීම පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.

- බ්‍රේල් (Braille), විශාල අකුරු සහිත මුද්‍රණ (Large Print), කථන පොත් / කැසට් (Audio books on cassette), ඉලෙක්ට්‍රොනික පොත් (E-Book) සහ ඩේසි කථන පොත් (Daisy audio books) වැනි පහසුවෙන් ග්‍රහණය කරගැනීමට සහ ප්‍රවේශවීමට හැකියාව ඇති කියවීමේ ආකෘති වෙත සිසුන් යොමු කරවීම හා ඒවා පරිහරණය කිරීමට අවශ්‍ය සහාය ලබාදීම.

- දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ඒවා සපුරා ගැනීම වෙනුවෙන් වන තොරතුරු ඒකකයක් ජාතික පුස්තකාලය ඇතුළුව මහජන පුස්තකාලවල ආරම්භ කිරීම හා පවත්වාගෙන යාමත් ඒ සම්බන්ධයෙන් මෙම ප්‍රජාව දැනුවත් කිරීම් සිදු කිරීම.

- මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන (සමාජ සංවර්ධන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව, අන්ධ විද්‍යාලය, දෘශ්‍යාබාධිත උපාධිධාරීන්ගේ මණ්ඩලය, ඬේසි ලංකා පදනම) සම්බන්ධවෙමින් පහසුවෙන් තොරතුරු ලබාගැනීම වෙනුවෙන් අන්තර් පුස්තකාල පිරුළු සේවාව ආරම්භ කිරීම. ඒ ඔස්සේ එම පුස්තකාලවල තිබෙන පොත්පත් හා අනෙකුත් සම්පත් ශිෂ්‍ය /ශිෂ්‍යාවන්, ගුරුවරුන් හා පාඨක ප්‍රජාව අතර හුවමාරු කර ගැනීමේ හැකියාව හිමිවේ.

- මෙම සිසුන්ගේ පරිගණක හා අන්තර්ජාල භාවිතය අවම අගයක් ලබා ගන්නා බැවින් පාසැල් පුස්තකාල ආශ්‍රිතව එම පහසුකම් පාඨකයන් වෙත ලබා දීම ක්‍රමවත් කිරීම වෙනුවෙන් සහ එම පාඨකයන් වෙත මාර්ගෝපදේශ හා අවශ්‍ය සහාය පුස්තකාල කාර්යමණ්ඩලය විසින් ලබා දීම.

- පාසැල් පුස්තකාල එකතුවේ පවතින ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපකරණ (ශ්‍රව්‍ය පට, වීඩියෝ පට, පරිගණක තැටි, අන්තර්ජාල සම්පත්) එකතුව සංවර්ධනය කිරීම හා නවතම උපකරණ ඒ ඒ පුස්තකාල වෙත අත්පත් කර ගැනීම.

- නිවස තුළ පොත් එකතුවක් ආරම්භ කිරීමට හා පොත් එකතුවක් පවතින්නේ නම් එය තවදුරටත් සංවර්ධනය කිරීමට හා කළමනාකාරණය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම මෙන්ම දැනුවත් කිරීම් කටයුතු සිදු කිරීම හා දිරි ගැන්වීම.

- පාසැල් පුස්තකාල හා මහජන පුස්තකාල මඟින් අන්ධ හා දෘශ්‍යාබාධිත පාඨක සමාජ (Reading Socities) ආරම්භ කිරීම හා එමඟින් කියවීම හා ඒ ආශ්‍රිත නව ප්‍රවණතා පාඨකයන් අතර හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසීම.

- පාඨකයන්ගේ භාවිතය සඳහාත් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරගැනීමටත්, නිදහස් මනසකින් යුක්තව කාලය ගත කිරීමටත් පාසැල් පුස්තකාල පරිශ්‍රය (අභ්‍යන්තර හා බාහිර) සකස් කිරීම.

- පාඨකයන් වෙත සහනදායී මිල ගණන් යටතේ පොත් මිලදී ගැනීමට අවස්ථාව සලසා දීම. උදාහරණයක් ලෙස සාහිත්‍ය මාසය කාලසීමාව තුළදී සහනදායී මිල ගණන් යටතේ පොත් මිලදී ගැනීම සඳහා පොත් ප්‍රදර්ශන පැවැත්වීම හා පොත් ප්‍රකාශකයන් සමඟ සම්බන්ධීකරණය කර සහනදායී අවස්ථාවන් සලසා දීම.

- 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය (The 2030 Agenda for Sustainable Development) හඳුන්වා දෙන ලදී. එම අරමුණු 17 අතුරෙන් විශේෂයෙන්ම තිරසර සංවර්ධන අරමුණ 04 එනම් ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම (Quality Education for All) වෙනුවෙන් පුස්තකාල විශාල කාර්ය භාර්යයක් ඉටු කරන බැවින් පාසැල තුළ සහ ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා තිබෙන පුස්තකාල මඟින් මෙම පාඨකයන් වෙත අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශවීමට සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා රජය හා රාජ්‍ය නොවන මට්ටමින් එම පුස්තකාල වෙත අවශ්‍ය සහයෝගය ලබා දීම අත්‍යවශ්‍ය වේ.

- පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විශේෂිත ආයතන, සංවිධාන (ජාතික/ජාත්‍යන්තර) සමග අන්තර් සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- අන්ධ හා දෘශ්‍යාබාධිත පාසැල් සිසුන් හා එම ප්‍රජාව වෙනුවෙන් සාහිත්‍ය මාසය හා කියවීමේ මාසය ඉලක්ක කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ විවිධ වැඩ සටහන් සංවිධානය කිරීම හා ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ සහයෝගය ලබා ගැනීම.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Allan Leach. (1991). The meaning of Braille. Asian Pacific Book Development, 22(3), Asian Cultural Centre for UNESCO.

Clark. C. & Rumbold. K. (2006). Reading for Pleasure. A research overview. Report, National Literacy Trust, UK. http://www.literacytrust.org.uk/assets/0000/0562/Reading_pleasure_2006.pd

Department of Census and Statistics. (2012). Census of Population and Housing.Colombo,Department of Census and Statistics.

Disabled World. (09 28, 2022). Disabled World. https://www.disabled world.com

Gerver, E. (2003). The benefits and barriers to computer use for individuals who are visually impaired. Journal of visual impairment and Blindness. 97(9), 536-550. 12 15p.http://web.a.ebscohost.com/ehost/pdfviewer/pdfviewer?vid=4&sid=6736888d-d929- 4d4d-a5b4-f1a6e13876f7%40sessionmgr4010.

WHO (2017) Visual Impairment and Blindness Fact Sheet No. 282. http://www.who.int/news-room/fact-sheets/detail/blindness-and-visual-impairment

World Health Organization. (09 28, 2022). Disability. World Health Organization https://www.who.int/health-topics/disability#tab=tab_1

UN. (2016). Transforming Our World: The 2030 Agenda for Sustainable Development. United Nations. Retreived from: https://sustainabledevelopment.un.org/content/documents/21252030%20Agenda%20for%20Sustainable%20Development%20web.pdf

ෆර්නැන්ඩු. ජානකී. (1992). අන්ධ සහ දෘශ්‍යාබාධිතයින් සඳහා පුස්තකාල සේවා. පුස්තකාල ප්‍රවෘත්ති, 13වෙළුම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ෆර්නැන්ඩු. ජානකී. (1990). ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි අන්ධ සහ දෘශ්‍යාබාධිතයින් සඳහා පුස්තකාල සේවා සැපයීමේ ව්‍යාපෘතිය. පුස්තකාල ප්‍රවෘත්ති, 6 වෙළුම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**ඇමුණුම 01 - සමීක්ෂණයට අදාළ ප්‍රශ්නාවලිය**

**ප්‍රශ්නාවලි අංකය :**

**දෘශ්‍යාබාධිත පාසැල් සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා හා ඒවා සපුරා ගැනීමේදී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය**

**01. ප්‍රතිචාරිකයාගේ පසුබිම් තොරතුරු**

1.1 ස්ත්‍රී / පුරුෂ භාවය

1. ස්ත්‍රී ☐
2. පුරුෂ ☐

1.2 වයස : ..........................................................................................

1.3 පාසලේ නම : ..........................................................................................

1.4 ශ්‍රේණිය : ..........................................................................................

1.5 ජන වර්ගය :

1. සිංහල ☐
2. දෙමළ ☐
3. මුස්ලිම් ☐
4. මැලේ ☐
5. බර්ගර් ☐
6. වෙනත් ☐

1.6 ආගම :

1.බෞද්ධ ☐
2.හින්දු ☐
3.ඉස්ලාම් ☐
4.කතෝලික ☐
5.වෙනත් ☐

1.7 වර්තමාන පදිංචිය

1. දෙමව්පියන් සමග (මව/පියා) ☐
2. පවුලේ වෙනත් ඥාතියෙකු සමග ☐
3. භාරකරුවෙකු සමග ☐
4. පාසල් නේවාසිකාගාරය ☐
5. වෙනත් .......................................................................................

## 02. දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධ තොරතුරු

2.1 දෘශ්‍යාබාධිතභාවය හා ඒ සම්බන්ධව ඔබට ඇත්තේ කුමන රෝගී ස්වභාවයක් ද?

1. පූර්ණ අන්ධභාවයට පත් වූ ☐
2. එක් ඇසක් පමණක් අන්ධභාවයට පත්වූ ☐
3. දෘෂ්ඨි ඌනතා ඇති ☐
4. වෙනත් .............................................................................

2.2 දෘශ්‍යාබාධිතභාවය සම්බන්ධව ආබාධිත තත්වයට පත්වීමට හේතුන් කවරේද?

1. උපතින්ම ☐
2. හදිසි අනතුරු/ ගැටුම් හේතුවෙන් ☐
3. වෙනත් කායික රෝගී තත්වයක් ☐
4. උපතේ සිට කාලයත් සමග ස්වාභාවිකව ☐
5. වෙනත් .............................................................................

2.3 ඔබ උපැස් යුවළක් භාවිත කරන්නේද? 1. ඔව් ☐ 2. නැත ☐

2.4 භාවිත කරන්නේ නම් භාවිතය පටන් ගත් කාලසීමාව සඳහන් කරන්න.

වසර ☐ මාස ☐

2.5 දෘශ්‍යාබාධිත තත්වය හේතුවෙන් ඔබ කිසියම් ආධාරක ක්‍රමෝපායන් භාවිත කරන්නේද?

1. ඔව් ☐ 2. නැත ☐

2.6 ඔව් නම්, එසේ භාවිත කරන ජංගම ආධාරක ක්‍රමය කුමක්ද?

1. සැරයටිය ☐
2. බාධක ආධාරකය ☐
3. උපකාරක සහායකයෙක් ☐
4. වෙනත් .............................................................................

## 03. තොරතුරු ලබා ගැනීමේ හා කියවීමේ /ශ්‍රවණය කිරීමේ ද්‍රව්‍ය හා පුරුදු

3.1 ඔබ වැඩියෙන්ම තොරතුරු ලබාගැනීමට / කියවීමට හා ශ්‍රවණය සඳහා කැමැත්තක් දක්වන්නේ ඇයි?

1. අධ්‍යාපන අවශ්‍යතා සඳහා ☐
2. සාමාන්‍ය දැනුම ලබා ගැනීම සඳහා ☐
3. වෙනත් තොරතුරු ලබාගැනීම සඳහා ☐
4. සතුට/ විනෝදාස්වාදය සඳහා ☐
5. වෙනත් ..............................................................................

3.2 ඔබ විසින් තොරතුරු ලබා ගන්නා වඩාත් ප්‍රියතම මාධ්‍යය/මාධ්‍යයන් මොනවාද?

1. පාසල් පුස්තකාලය ☐
2. අන්තර්ජාලය ☐
3. ගුරුවරුන්ගෙන් ☐
4. දෙමව්පියන්ගෙන් ☐
5. මිතුරන්ගෙන් ☐
6. වෙනත් ..............................................................................

3.3 පාසල් පුස්තකාලයට අමතරව ඔබ විසින් වෙනත් පුස්තකාල භාවිත කරන්නේද ?

1. ඔව් ☐ 2. නැත ☐

3.4 ඔව් නම් එම පුස්තකාල මොනවාද? ....................................................................

..........................................................................................................................

3.5 ඔබ විසින් තොරතුරු ලබා ගන්නට හා විමර්ශනය සඳහා පාසල් පුස්තකාලය භාවිත කරන වාර ගණන සඳහන් කරන්න.

1. දිනපතා ☐
2. සතියකට වරක් ☐
3. සති 02 කට වරක් ☐
4. කලාතුරකින් ☐
5. කවදාවත් නැත ☐

3.6 ඔබ විසින් තොරතුරු වෙත ප්‍රවේශ වීමේදී කුමන ආකාරයේ කියවීමේ ආකෘතින් භාවිත කරන්නේද?

1. බ්‍රේල් (Braille)
2. විශාල අකුරු සහිත මුද්‍රණ (Large Print)
3. ඉතා විශාල අකුරු සහිත මුද්‍රණ ( Giant print )
4. කථන පොත් / කැසට් (audio books on cassette)
5. කථන පොත් CD/DVD (Audio book on CD/DVD)
6. ඩේසි කථන පොත් (Daisy audio Books)
7. ඊ බුක් (E Book)
8. අන්තර්ජාලය (Internet )
9. වෙනත් ..........................................................................................................

3.7 එම ආකෘතීන් අතුරින් වැඩියෙන්ම කැමති හා භාවිත කරන ආකෘතිය කුමක්ද? අනුපිළිවෙල අනුව 123........ ලෙස අංක යොදන්න.

| ආකෘතිය | වැඩියෙන්ම කැමති | වැඩියෙන් භාවිත කරන |
|---|---|---|
| 1. බ්‍රේල් (Braille) ) | | |
| 2. විශාල අකුරු සහිත මුද්‍රණ (Large Print) | | |
| 3. ඉතා විශාල අකුරු සහිත මුද්‍රණ (Giant Print) | | |
| 4. කථන පොත් කැසට් (Audio book on cassette ) | | |
| 5. කථන පොත් CD ( Audio book on CD ) | | |
| 6. ඩේසි කථන පොත් ( Daisy audio books ) | | |
| 7. ඊ බුක් (E Book) | | |
| 8. වෙනත් | | |

3.8 එසේ භාවිත කිරීමට හේතුව/ හේතු සඳහන් කරන්න.

1. තොරතුරු වෙත ප්‍රවේශවීමේ පහසුව ☐
2. උපකරණයේ/ආකෘතියේ ප්‍රමාණය ☐
3. භාවිතයට ඇති පහසුව ☐
4. වියදම අඩු බව ☐
5. වෙනත් ...........................................................................................

3.9 තොරතුරු වෙත ප්‍රවේශවීමේදී කියවීම හා ශ්‍රවණය ආශ්‍රිත ද්‍රව්‍ය ලබාගැනීම අත්‍යවශ්‍යය. ඒ අනුව ඔබගේ පවුලේ සාමාජිකයන් විසින් ඔබ වෙනුවෙන් පසුගිය මාසයක කාලය තුළ කියවීම් ද්‍රව්‍ය මිලදී ගත්තේද? 1. ඔව් ☐ 2. නැත ☐

3.10 නැති නම් ඊට හේතුව / හේතු සඳහන් කරන්න.

1. මුදල් නොමැති බව ☐
2. කාලය නොමැති බව ☐
3. අවශ්‍යතාවක් නොමැති බව ☐
4. සම්පත් හිඟවීම ☐
5. වෙනත් ...........................................................................................

3.11 ඔව් නම් එම කියවීම් ද්‍රව්‍යය මොනවාද?

1. පොත් ☐
2 සඟරා ☐
3. පුවත්පත් ☐
4. වෙනත් ...........................................................................................

3.12 ඔබට අවශ්‍ය කියවීම් ද්‍රව්‍ය තෝරා ගන්නේ කෙසේද?

1. කතෘත්වය ☐
2. රුචිකත්වය ☐
3. පෙර අත්දැකීම් ☐
4. ප්‍රවේශවීමේ පහසුව ☐
5. ග්‍රන්ථයේ ප්‍රමාණය ☐
6. ග්‍රන්ථ විශේෂය ☐
7. පුස්තකාලයේ නිර්දේශ මත ☐
8. පවුලේ සාමාජිකයන්ගේ උපදෙස් අනුව ☐
9. මිතුරන්ගෙන් ☐
10. ගුරුවරුන්ගේ උපදෙස් අනුව ☐
11. වෙනත් ...........................................................................................

3.13 තොරතුරු ලබා ගැනීමේදී ඔබ විසින් ජනමාධ්‍ය භාවිත කරන්නේද?

1. ඔව් ☐ 2. නැත ☐

3.14 ඔව් නම්, එසේ භාවිත කරනු ලබන ජනමාධ්‍ය මොනවාද?

1. රූපවාහිනිය ☐
2 ගුවන් විදුලිය ☐
3. පුවත්පත් ☐
4. අන්තර්ජාලය ☐
5. සඟරා / ලිපි ☐
6. වෙනත් ..........................................................................................

3.15 ඔබ විසින් කියවීමට (Braille) මාධ්‍යය හෝ ශ්‍රවණයට කථන මාධ්‍යය පුවත්පත් (Talking Newspaper) භාවිත කරන්නේද? 1. ඔව් ☐ 2. නැත ☐

3.16 ඔව් නම් ඔබ වඩා කැමති පුවත්පත් 2 ක් නම් කරන්න

1. ....................................
2. ....................................

## 04. පරිගණක /අන්තර්ජාලය භාවිතය

4.1 පාසල තුල විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා පරිගණක ඩෙස්ක්ටොප්/ ලැප්ටොප්/ ටැබ් පරිගණක භාවිත කරන්නේද? 1. ඔව් ☐ 2. නැත ☐

4.2 තොරතුරු ලබාගැනීමේදී පරිගණක භාවිතය හා ඒ සම්බන්ධ සංකල්ප පිළිබඳ අවබෝධය සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක්ද?

1. ඉතා ඉහලයි ☐
2. සාමාන්‍යයයි ☐
3. දුර්වලයි ☐
4. අවබෝධයක් නොමැත ☐

4.3 අධ්‍යාපන කටයුතු සිදු කිරීමට / තොරතුරු වෙත ප්‍රවේශවීමට නව තාක්ෂණයෙන් සමන්විත ඔබටම අයත් පරිගණකයක් භාවිත කරන්නේද?

1. ඔව් ☐ 2. නැත ☐

4.4 එසේ පවතිනවා නම් පරිගණකය නිවසේදී භාවිත කරන වාර ගණන වනුයේ

1. දිනපතා
2. සතිපතා
3. සති 02 කට වරක්
4. සාමාන්‍යයෙන්
5. කවදාවත් නැත

4.5 එසේ නොවේ නම්, ඒ සඳහා බලපාන හේතූන් කවරේද?

1. පරිගණක භාවිතය/සංකල්ප පිළිබඳ දැනුමක් නොමැති වීම
2. ඒ පිළිබඳ කැමැත්තක් /අවශ්‍යතාවයක් නොමැති වීම
3. පරිගණකය/අන්තර්ජාලය අවබෝධ කර ගැනීමට අපහසු සංකීර්ණ මාධ්‍යයක් වීම
4. පරිගණකයක් මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍යමය අපහසුතා
5. අන්තර්ජාල පහසුකම් නොමැති වීම
6. තවමත් අධ්‍යාපනය ලබන අවධියේ පසුවන බැවින් පරිගණක භාවිතයට අවධානය යොමු නොවීම
7. වෙනත් ..........................................................................................

4.6 පරිගණක ආශ්‍රිතව සම්පත් භාවිත කිරීමට /ප්‍රවේශවීම සඳහා අරමුණු මොනවාද?

1. අධ්‍යාපනික කටයුතු යාවත්කාලීන කර ගැනීමට
2. ව්‍යාපෘති/පැවරුම් සිදු කිරීමට
3. විෂය සමගාමී තොරතුරුවලට වඩා වෙනත් තොරතුරු/දැනුම ලබා ගැනීමට
4. සතුට/විනෝදාස්වාදය සඳහා
5. වෙනත් ..........................................................................................

4.7 පාසල තුළදී අන්තර්ජාලය භාවිත කිරීමේදී /ප්‍රවේශවීමේදී ඔබ විසින් මුහුණපාන ගැටලු මොනවාද?

1. තොරතුරු තාක්ෂණය සම්බන්ධ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
2. තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ගුරුවරුන්ට / කාර්යමණ්ඩලයට අවශ්‍ය දැනුම අවම වීම
3. දුර්වල අන්ර්ජාල සබඳතාවයන්
4. පාසල් පුස්තකාලය තුළ තොරතුරු නව තාක්ෂණ පහසුකම් පැවතීම සම්බන්ධයෙන් තිබෙන දැනුවත්භාවය අවම වීම
5. කිසිදු බාධාවක්/ ගැටලුවක් නොමැත
6. වෙනත් ..........................................................................................

## 05. තොරතුරු ලබා ගැනීමේදී කියවීම/ශ්‍රවණය පිළිබඳ ආකල්ප

5.1 පසුගිය කාලයට සාපේක්ෂව වර්තමානයේ තොරතුරු ගවේෂණයට ගතකරන කාලය සම්බන්ධව ඔබේ මතය කුමක්ද?

1. වර්ධනයක් දක්නට ලැබේ ☐
2. වර්ධනයේ අඩුවීමක් දක්නට ලැබේ ☐
3. සාමාන්‍යය තත්වයකි ☐
4. කිසිදු වෙනසක් නොමැත ☐
5. වෙනත් ..........................................................................................

5.2 එම කාලය තුල කියවීම හෝ ඊට අදාල කටයුතු වල වර්ධනයක් දක්නට ලැබුනේ නම්, ඒ සඳහා බලපෑ හේතූන් කවරේද?

1. අධ්‍යාපනික අවශ්‍යතා සඳහා ☐
2. කියවීම විනෝදජනක වීම ☐
3. අනෙකුත් කාර්යයන්ට වඩා කියවීම වඩාත් ඵලදායිවීම ☐
4. කියවීමේ ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් පරිහරණයට අවස්ථාව සැලසීම ☐
5. මූල්‍යමය හැකියාව ☐
6. වෙනත් ..........................................................................................

5.3 පාසල් අධ්‍යයන කටයුතුවලදී මුද්‍රිත සම්පත් භාවිතයට වඩා ශ්‍රවණය ආශ්‍රිත සම්පත් / මාධ්‍යවලට ඔබ කැමැත්තක් දක්වන්නේද?

1. ඔව් ☐ 2. නැත ☐

5.4 ඔව් නම්, එසේ කැමැත්තක් දැක්වීමට හේතුව සඳහන් කරන්න

1. භාවිතය පහසුයි ☐
2. කාලය ඉතිරි වේ ☐
3. විශාල තොරතුරු පරාසයකට ප්‍රවේශ වීමට හැකි වීම ☐
4. යාවත්කාලීන තොරතුරුවලට ප්‍රවේශවීමේ පහසුව ☐
5. ඉහත සඳහන් සියල්ලම ☐
6. වෙනත් ..........................................................................................

## 06. තොරතුරු ලබා ගැනීමේදී හා ඒ සඳහා ප්‍රවේශ විමේදී මූණපාන ගැටලු හා බාධක

6.1 තොරතුරු ලබැගැනීමේදී හා ඒ සඳහා ප්‍රවේශවීමේදී ඔබ විසින් මුහුණපාන ගැටලු මොනවාද?

1. ප්‍රමාණවත් කියවීම් ද්‍රව්‍ය/ ශ්‍රවණය කිරීමේ ද්‍රව්‍ය නොතිබීම ☐
2. දෘශ්‍යාබාධිතභාවය සම්බන්ධව නැවත කියවීමේ තාක්ෂණික මෙවලම් හිඟ බව ☐
3. මූල්‍යමය දුෂ්කරතා ☐
4. පාසල් පුස්තකාල සතුව ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම ☐
5. භාෂාමය බාධක පැවතීම ☐
6. තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය සහායකයෙක් / මගපෙන්වන්නෙක් නොමැතිකම ☐
7. දෙමාපියන් මගින් සුවිශේෂි අවධානයන් මේ කෙරෙහි යොමු නොකිරීම ☐
8. වෙනත් ..........................................................................................

6.2 ඉහත සඳහන් කළ ගැටලු මඟහරවා ගැනීමට/ අවම කර ගැනීමට පාසල් ශිෂ්‍යයන් වශයෙන් ඔබගේ අදහස්/ යෝජනා ඉදිරිපත් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
www.natlib.lk

ISBN 978-624-5747-10-8
9 786245 747108